ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික) රැකියා අවස්ථා සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම. – 2026

01. ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික) පුරප්පාඩු 03 ක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.10.09 වේ.

02. බඳවා ගැනීමේ පොදු සුදුසුකම්

2.1 අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2.2 ඌව පළාතේ අවම වශයෙන් අවුරුදු තුනක (03) ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

2.3 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

2.4 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.5 2026.10.09 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි අයෙකු විය යුතුයි. (2008.10.09 දිනට හෝ ඊට පෙර, 1996.10.09 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කළ හැකිය.)

2.6 සෑම අයදුම්කරුවෙකුම ඌව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.7 සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. අධ්‍යාපන, වෘත්තිය සුදුසුකම් හා පළපුරුද්ද:

අධ්‍යාපන සුදුසුකම්

3.1 ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් (02) සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් (ඇමුණුම 1 හි සඳහන්) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම

සහ

3.2 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය/විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එක වරකදි සමත්වීම

වෘත්තිය සුදුසුකම්

I. මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (NDES) හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා NVQ 06 මට්ටමට සමාන සුදුසුකම් ලබා තිබීම

හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

04. බඳවා ගැනීමේ ක්‍රමවේදය

4.1. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව ලැබෙන අයදුම්පත් ප්‍රමාණය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු ප්‍රමාණයක් නම් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් ද, ලැබෙන අයදුම්පත් ප්‍රමාණය පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි නම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්ද කොන්ත්‍රාත් පදනමින් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

05. සේවා කොන්දේසි

5.1 වසරක කාලයක් සඳහා පමණක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ. අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී මෙම කොන්ත්‍රාත් පදනමින් ලබා දෙන්නා වූ පත්වීම අහෝසි කිරීම සඳහා ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

5.2 මේ සඳහා ඉල්ලුම් කරන සියලුම දෙනා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම අනිවාර්යයෙන්ම සිදුකරනු ලබන බවට නොසැලකිය යුතුයි.

06. **වැටුප් පරිමාණ**

මෙම තනතුර සඳහා 2025.03.25 දිනැති අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව තාක්ෂණ නිලධාරී කාර්මික නිලධාරි III ශ්‍රේණියේ තනතුරට හිමි MN-3-2025 වැටුප් පරිමාණයේ උපලේඛණ III හි ආරම්භක වැටුප් පියවර වන රු. 52,250/- ක මාසික ගෙවීමක් සිදු කරනු ලැබේ. එහෙත් ඔබට ගෙවීම් කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ. ඔබගේ කොන්ත්‍රාත් දීමනාව සමඟ ජීවන වියදම් දීමනාව එකතු කර ගෙවනු ලැබේ.

අයදුම්පත්‍රය ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2026.10.09 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ඌව පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම– 2026" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

07. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු / කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

08. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලබන සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණයද ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

(එල්.ඒ.සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2026.09.24 වැනි දින,
බදුල්ල,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

ආදර්ශ අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ
කාර්මික නිලධාරි (යාන්ත්‍රික) රැකියා අවස්ථා සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම - 2026

01. අයදුම්කරු පදිංචි දිස්ත්‍රික්කය :..

02. භාෂා මාධ්‍යය : [ ] සිංහල - 1, දෙමළ - 2, ඉංග්‍රීසි - 3

03. 3.1 මුලකුරු සමඟ නම :..
Mr/Mrs/Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- HERATH A.M.N)

3.2 මුලකුරු සමග නම :..
මයා/මිය/මෙනෙවිය (සිංහලෙන්/දෙමළෙන්)

3.3 මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...

3.4 මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :...

04. 4.1 ස්ථිර ලිපිනය :..
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
....

4.2 ස්ථිර ලිපිනය :..
(සිංහලෙන් / දෙමළෙන්)

4.3 විද්‍යුත් තැපැල් ලිපිනය :..

4.4 ජංගම දුරකථන අංකය :

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. 6.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 / පුරුෂ - 0 [ ]

6.2 උපන් දිනය : අවුරුද්ද [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

6.3 2026.10.09 දිනට වයස : අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

07. 2026.10.09 දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව : අවුරුදු [ ] මාස [ ] දින [ ]

08. විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 / විවාහක - 0 [ ]
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

09. අධ්‍යාපන සුදුසුකම් :-

9.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :

	වර්ෂය :......................		විභාග අංකය :......................		
	විෂයය	සාමාර්ථය		විෂයය	සාමාර්ථය
1			6		
2			7		
3			8		
4			9		
5			10		

9.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය :

	වර්ෂය :......................	විභාග අංකය :......................
	විෂයය	සාමාර්ථය
1		
2		
3		
4		

9.3 වෘත්තිය (තාක්ෂණ) සුදුසුකම්

ආයතනය	හදාරා ඇති පාඨමාලාව	පාඨමාලාවේ වලංගු දිනය	NVQ මට්ටම	NVQ සහතිකයේ අංකය	සහතික පත්‍රය වලංගු දිනය

10. අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (අදාළ වේ නම්) :
....
....
....

11. ගෙවා ඇති විභාග ගාස්තුව රු. :...
විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය හා දිනය :..
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..

මුදල් ගෙවූ ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න

12. **අයදුම්කරුගේ සහතිකය :**

.... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව දනිමි. තවද, තරඟ විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය :... ....

අයදුම්කරුගේ අත්සන

---

13. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... ලිපිනයේ පදිංචි .... මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත්, ඔහු / ඇය .... වන දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද මෙයින් සහතික කරමි.
(අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය :..................................... ....

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන අයගේ සම්පූර්ණ නම:..
තනතුර :..
ලිපිනය :..
....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

---

14. **පළාත් රාජ්‍ය සේවයේ හෝ මධ්‍යම රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

I. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... මහතා/මහත්මිය/මෙනවිය .... දින සිට .... තනතුරේ මෙම ආයතනයේ/දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ වැඩ පැමිණීම, හැසිරීම සතුටුදායක බවද, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර, පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි/ නොහැකි බවත් නිර්දේශ කරමි.
(අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය :................................. ....

ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)